**අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව - 2020**

-------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

------------------------------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ව්‍යාපෘති 08 ක නිම්වැඩ වටිනාකම දැක්වීමකින් තොරව ලැබිය යුතු මුදල් ලෙස ගිවිසුම්ගත වටිනාකම කර්මාන්ත ණයගැතියන් යටතේ දක්වා තිබීමෙන් රු.105,562 ක් වැඩිපුර දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | රම්මුතුගම ප්‍රජා ශාලාවේ වැට හා ගේට්ටුව අලුත්වැඩියා කිරීමේ කර්මාන්තය සඳහා රු.56,089 ක මුදලක් 2019 වර්ෂයේ ණයහිමි යටතේ ගිණුම්ගත කර තිබුණ ද එය ඉටුකර නොතිබියදී තව දුරටත් ණය හිමියන් යටතේ දක්වා තිබුණි. | ව්‍යාපෘතිය මේ වන විටත්, ක්‍රියාත්මක කර නොමැති බව. | ව්‍යාපෘතිය ඉටු නොකිරීම පිළිබඳව අවශ්‍ය ක්‍රියා මාර්ග ගතයුතු අතර, ක්‍රියාත්මක නොවන්නේ නම් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ඇලගල ශ්‍රී පත්තිනි දේවාලය සංවර්ධනය කිරීම සඳහා වූ ව්‍යාපෘතියේ ණයගැති හා ණයහිමි ශේෂය රු.140,118 ක් වුවත්, රු.227,337 ක් ලෙස රු.87,219 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.49,000 ක් වටිනා ඇඹිලි සළකුණු යන්ත්‍රය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2021 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පසුගිය වර්ෂවල වෙන්දේසි කරන ලද හා විනාශ කරන ලද ස්ථාවර වත්කම් එකතුව රු.141,860 ක්, ඒ ඒ වර්ෂවල ගිණුම්වලින් ඉවත් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 16 ක එකතුව රු. 4,615,619 ක ශේෂ තහවුරු කිරීම සඳහා අවශ්‍ය උපලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | තොරතුරු සෙවීම සඳහා කමිටුවක් පත්කර ඇති බව. | තොරතුරු පරීක්ෂා කර ගිණුම් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

| | නීති, රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | රීති 177 | මිල ගණන් කැඳවීමකින් තොරව අවස්ථා දෙකකදී ජලමනු 30 ක් හා වීථි ලාම්පු 50 ක් හා උපාංග රු.204,995 කට මිලදී ගෙන තිබුණි. | මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ අනුමැතිය ලැබී ඇති බව. | නීති, රීති හා චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2006 පෙබරවාරි 21 දිනැති අංක 2006/02 දරන මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය | | | |
| | 02 ඡේදය | සභාපතිගේ ගමන් සෘජුවම පළාත් පාලනයට අදාළ කටයුත්තක් සඳහාම විය යුතු අතර, එකී ගමන් සඳහා කැඳවීම් ලිපි හා පැමිණීමේ සහතික මඟින් ගමන සනාථ කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ජනවාරි මස සිට අගෝස්තු මාසය දක්වා ගමන් වියදම් රු.43,000 ක් ගෙවා තිබුණි. | සියලු කැඳවීම් ලිඛිතව සිදු නොවන අතර, රාජකාරි අවශ්‍යතා මත ගෙවීම් කටයුතු කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.705,248 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.415,614 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 8 ක එකතුව රු.16,656,898 ක් අයකරගෙන නොතිබුණු අතර, ඉන් වසර 1ට වැඩි හා 5 ට අඩු රු.8,924,369 ක ශේෂයන් හා වසර 05 ට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින ශේෂය රු.3,115,722 ක් විය. | ලැබිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත හා විවිධ ණයහිමි එකතුව රු.11,963,811 ක් නිරවුල් කරගෙන නොතිබුණු අතර, ඉන් වසර 1 ට වැඩි හා වසර 5 ට අඩු රු.9,186,528 ක් හා වසර 5 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින ශේෂය රු.1,578,618 ක් විය. | ගෙවිය යුතු වියදම් කඩිනමින් ගෙවීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 1994 සිට 2007 හා 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.539,168 ක විගණන ගාස්තු වටිනාකමක් ණයහිමියන් යටතේ දක්වා තිබුණ ද මේ දක්වා අදාළ විගණන ගාස්තු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ගෙවීමට කටයුතු කරන බව. | විගණන ගාස්තු කඩිනමින් ගෙවීමට කටයුතු කළ යුතු වීම. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා අරමුදල් මත රු.100,751 ක ඇස්තමේන්තුවක් යටතේ තිබ්බටුකනත ක්‍රීඩාපිටියේ පැති බැම්ම ඉදි කිරීම සඳහා ග්‍රාම සංවර්ධන සමිතියක් සමඟ 2020 මාර්තු 11 දින රු.100,000 කට ගිවිසුම්ගතව ඉදිකිරීම් පවරා තිබුණි. අධීක්ෂණ කාර්මික නිලධාරිවරයා දැනුවත් කිරීමකින් හා අධීක්ෂණයකින් තොරව ඇස්තමේන්තුගත ප්‍රමිතියට අනුකූල නොවන ආකාරයෙන් ඉදිකිරීම් කටයුතු 2020 මාර්තු 16 දින අවසන් කර තිබුණි. එසේ අවිධිමත්ව කර තිබූ ඉදිකිරීම සඳහා සභාපතිවරයා විසින් ගෙවීම් සහතික කර රු.80,000 ක් 2021 මාර්තු 12 දින අදාළ කොන්ත්‍රාත්කාර සමිතිය වෙත ගෙවා තිබුණි. | මහා සභාවේ අනුමැතියට යටත්ව ගෙවීම් සිදුකර ඇති බව | අවිධිමත් ඉදිකිරීම් හා ගෙවීම් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |